සියලු ම හිමිකම ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| භූගෝල විද්‍යාව I | 22 S I | 13 ශ්‍රේණිය |
|---|---|---|
| පැය තුනයි | | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 |

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**විභාග අංකය :** ....................................................................

**උපදෙස්:**

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **තුනකින්** සමන්විත වේ.
- **I කොටස** බහුවරණ ප්‍රශ්න 40 කින් සමන්විත වන අතර, ඒවාට පිළිතුරු **මෙම පත්‍රයේ ම** සැපයිය යුතු ය.
- **I** කොටසේ නිවැරදි පිළිතුරක් සඳහා ලකුණු **එක** බැගින් හිමි වේ.
- **II** කොටසෙහි ප්‍රශ්න **දෙකටම** පිළිතුරු සැපයිය යුතු ය.
- **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- **I, II** සහ **III** කොටස්වල පිළිතුරු පත්‍ර එකට අමුණා භාර දිය යුතු ය.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි**

| | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| I කොටස | 1 - 40 | |
| II කොටස | 1 | |
| | 2 | |
| III කොටස | 3 | |
| | 4 | |
| | 5 | |
| | 6 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

## I කොටස

- ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර අඩංගු වරණය තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියේ ඇති **තිත් ඉර** මත ලියන්න.

01. අවකාශීය හා අවකාශීය නොවන දත්ත සඳහා නිදසුනක් බැගින් පිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) ළිඳක ගැඹුර හා පාසලක සිටින ළමයි සංඛ්‍යාව.
(2) මාර්ගයක විහිදීම හා වැවක ව්‍යාප්තිය.
(3) වනාන්තරයක ව්‍යාප්තිය හා විදුලි රැහැනක ධාරිතාව.
(4) දිස්ත්‍රික්කයක ජන ඝනත්වය හා සමෝච්ච රේඛාවක විහිදීම.
(5) වගාබිමකින් ලැබෙන අස්වැන්න හා ගංගාවක විහිදීම. (........)

02. 1:50,000 සිතියමක ජාතික බණ්ඩාංක රේඛා දෙකක් අතර අන්තරය කොපමණ ද?

(1) 5 cm (2) 10 cm (3) 15 cm (4) 20 cm (5) 25 cm (........)

දෙවැනි පිටුව බලන්න

03. සම සංඛ්‍යා සිතියමක් මඟින් ඉදිරිපත් කළ **නොහැකි** විචල්‍යයකි,

(1) වර්ෂාපතනය (2) උච්චත්වය (3) බර (4) පීඩනය (5) ගැඹුර (........)

04. 1:50,000 සිතියම් කොටසක දැක්වෙන සෘජුකෝණාස්‍රාකාර කුඹුරු යායක දිග හා පළල 12 cm × 6 cm වේ. මෙම සිතියම් කොටස 1:75,000 පරිමාණයට නිර්මාණය කළ විට අදාළ කුඹුරු යායේ දිග හා පළල නිවැරදිව දැක්වෙන වරණය කුමක් ද?

(1) 8 cm × 4 cm (2) 18 cm × 9 cm (3) 24 cm × 12 cm

(4) 4 cm × 2 cm (5) 6 cm × 3 cm (........)

05. භූගෝලීය තොරතුරු පද්ධතියට අයත් ආදාන උපාංග පමණක් දැක්වෙන වරණය වන්නේ,

(1) චුම්භක තැටි, අංකන ඵලකය, මුද්‍රණ යන්ත්‍රය

(2) අංක ඵලකය, තිර සංඛ්‍යාංකනය, සංදර්ශකය

(3) සංදර්ශකය, සුපිරික්සන, අංකන ඵලකය

(4) සංදර්ශකය, මුද්‍රණ යන්ත්‍රය, චුම්භක තැටි

(5) අංකන ඵලකය, සුපිරික්සන, තිර සංඛ්‍යාංකනය (........)

06. 1:50,000 සිතියම් පත්‍රයක සූචකයේ මංමාවත් නැමති උප ශීර්ෂය යටතේ දැක්වෙන සංකේතයක් **නොවන්නේ** කුමක් ද?

(1) ප්‍රධාන මාර්ගය (2) සෙසු මාර්ගය (3) පටු මාර්ගය

(4) කරත්ත පාර (5) ඉදිකරන ප්‍රධාන මාර්ගය (........)

07. අසමූහිත දත්ත ව්‍යාප්තියක් සමූහිත දත්ත ව්‍යාප්තියක් බවට පත් නොකර නිර්මාණය කළ හැකි ප්‍රස්තාර වර්ගයකි,

(1) සමුච්චිත සංඛ්‍යාත වක්‍රය (2) සංඛ්‍යාත බහු අස්‍රය (3) ජාල රේඛය

(4) විසරණ සටහන (5) ප්‍රතිශත සමුච්චිත සංඛ්‍යාත වක්‍රය (........)

08. පහත දැක්වෙන සමීකරණයේ C අක්ෂරයෙන් දැක්වෙන්නේ කුමක් ද?

$$Mdn = l + \left(\frac{\frac{N}{2} - fb}{fw}\right)C$$

(1) සංඛ්‍යාතය

(2) අපගමනය

(3) පන්ති ප්‍රාන්තරයේ තරම

(4) පන්ති ප්‍රාන්තරයේ මැද අගය

(5) උපකල්පිත මධ්‍යන්‍යය ඇති පන්තියේ මධ්‍ය අගය (........)

09. ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතියට අයත් අභ්‍යවකාශ උපාංග පිළිබඳ නිරවද්‍ය ප්‍රකාශය තෝරන්න.

(1) කක්ෂ තල හතරක චන්ද්‍රිකා රඳවා තිබෙයි.

(2) එක් කක්ෂ තලයක චන්ද්‍රිකා හයක් රඳවා ඇත.

(3) අතිරේක චන්ද්‍රිකා අටක් අභ්‍යවකාශයේ රඳවා තිබේ.

(4) සෑම චන්ද්‍රිකාවක්ම දිනකට දෙවරක් පෘථිවිය වටා ගමන් කරයි.

(5) සෑම චන්ද්‍රිකාවක්ම පැයට කිලෝමීටර් 12000 ක වේගයෙන් ගමන් කරයි. (........)

10. සක් සටහනක පවතින ප්‍රධාන වාසියකි.

(1) නිර්මාණය ඉතාම පහසු වීම.

(2) සංයුතිය මැනවින් ඉදිරිපත් කළ හැකිවීම.

(3) එක් වරකදී විචල්‍ය කීපයක් දැක්විය හැකිවීම.

(4) නිරපේක්ෂ වටිනාකම් පිළිබඳ දැනගත හැකිවීම.

(5) කුඩා අන්තරයක් සහිත දත්ත මැනවින් ඉදිරිපත් කළ හැකිවීම. (........)

11. මෙසෝගෝලයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ,

(1) දෛනික උෂ්ණත්ව අන්තරය ඉහළ අගයක් ගැනීම.

(2) වායුගෝලයේ උෂ්ණත්වය අඩුම ස්තරය වීම.

(3) උන්නතාංශය වැඩි වීමත් සමඟ උෂ්ණත්වය වැඩිවීම.

(4) පෘථිවිය කරා පැමිණෙන ග්‍රහක කොටස් දැවී විනාශවීම.

(5) ඕසෝන් ස්තරය මගින් පාරජම්බුල කිරණ අවශෝෂණය. (........)

12. ජුරාසික යුගයට අයත් අවසාදිත පාෂාණ හමුවන ස්ථාන තුනකි,

(1) පදවිය, තබ්බෝව හා පල්ලම

(2) ආඬිගම, තබ්බෝව හා පල්ලම

(3) ආඬිගම, කුදිරමලේ හා තෝනිගල

(4) පදවිය, තෝනිගල හා එප්පාවල

(5) තබ්බෝව, පදවිය හා තෝනිගල (........)

13. පහත දැක්වෙන සිතියමේ අංක 1, 2 හා 3 වශයෙන් දැක්වෙන ප්‍රදේශවල ව්‍යාප්ත කෙපන්ගේ උප දේශගුණ වර්ග අනුපිළිවෙලින් සඳහන් වරණය කුමක් ද?

(1) Am, Aw, Af

(2) Aw, Af, Am

(3) Af, Am, Aw

(4) Am, Af, Aw

(5) Af, Aw, Am

(........)




14. වැලිගල් විපරීතකරණ ක්‍රියාවලියට භාජනය වීමෙන් නිර්මාණය වන පාෂාණය කුමක් ද?

(1) නයිස් (2) ක්වාට්සයිට් (3) කිරිගරුඬ

(4) ශල්ක (5) යගල් (........)

15. පාෂාණ මුළුමනින්ම ද්‍රව ස්වභාවයේ පවතින පෘථිවි ස්තරය වන්නේ,

(1) සාගරික කබොල (2) ඉහළ ප්‍රාවරණය (3) පහළ ප්‍රාවරණය

(4) බාහිර හරය (5) අභ්‍යන්තර හරය (........)

16. පාංශු පැතිකඩක පෝෂිත මහලක් ලෙස හඳුනාගත හැක්කේ,

(1) O මහල (2) A මහල (3) B මහල

(4) C මහල (5) R මහල (........)

17. පහත දැක්වෙන විල් අතුරින් වඩාත් තාවකාලික විල කුමක් ද?

(1) ප්ලායා විල (2) ගිරි විල (3) ද්‍රෝණි විල

(4) පිත්තපටි විල (5) කල්දේරා විල (........)

18. ඩොල්ඩ්‍රම්ස් තීරය වෙතට ගමන් කරන සුළං ප්‍රවාහයකි,

(1) ගිනිකොන දිග වෙළෙඳ සුළං (2) වයඹ බටහිර සුළං (3) නිරිත බටහිර සුළං

(4) උතුරු ධ්‍රැව සුළං (5) දකුණු ධ්‍රැව සුළං (........)

19. පහත රූප සටහනේ දැක්වෙන විභේදය හා එම විභේදය සඳහා නිදසුනක් දැක්වෙන වරණය තෝරන්න.




(1) හෝර්ස් විභේදය ⟶ කොරියානු අර්ධද්වීපය
(2) සාමාන්‍ය විභේදය ⟶ සැන් ඇන්ඩ්‍රියාස් විභේදය
(3) සුවිභේද නිම්නය ⟶ රයින් නිම්නය
(4) හෝර්ස් විභේදය ⟶ රතු මුහුද
(5) සුවිභේද නිම්නය ⟶ සීනායි අර්ධද්වීපය (........)

20. යාබද ඡායාරූපයේ දැක්වෙන භූ රූපය කුමක් ද?



(1) රොෂ්මුටොන්නේ
(2) නුනටැක්ස්
(3) විෂමප්‍රාන්ත හෙළ
(4) අගම්ගල්
(5) බියුට (........)

21. කාර්ස් භූ රූප පමණක් දැක්වෙන වරණය තෝරන්න.

(1) කුමුටුවල, යාඩැම්, දෝලිනා, පොල්ජේ
(2) උවාලා, කුමුටුවල, සොයිගම, ලැපීස්
(3) ලැපීස්, උවාලා, හිරිලඹ, පොල්ජේ
(4) කේම, බාකන්, පොල්ජේ, කුමුටුවල
(5) කුමුටුවල, ඩුම්ලින, උවාලා, පොල්ජේ (........)

22. වායුගෝලීය උෂ්ණත්වය ඉහළයාමේ ප්‍රතිඵලයක් වශයෙන් ක්‍රමයෙන් වියැකියන සාගර ප්‍රවාහය කුමක් ද?

(1) කුරෝෂිවෝ ප්‍රවාහය (2) ලැබ්‍රදෝර් ප්‍රවාහය (3) ගල්ෆ් ප්‍රවාහය
(4) අගුල්හාස් ප්‍රවාහය (5) බ්‍රසීල් ප්‍රවාහය (........)

23. හිමකඳු ප්‍රපතනය කෙරෙහි බලපාන හේතුවක් **නොවන්නේ**,

(1) නැමී කඳු නිර්මාණය (2) භූමිකම්පා ඇතිවීම (3) ගෝලීය උණුසුම ඉහළ යාම
(4) යමහල් විධාරණය (5) න්‍යෂ්ටික අවි අත්හදා බැලීම (........)

24. 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ නියෝග අනුව පිහිටුවා ඇති ආයතනයකි,

(1) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
(2) මධ්‍යම පරිසර අධිකාරිය
(3) වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව
(4) භූ විද්‍යා හා පතල් කැණීම් කාර්යාංශය
(5) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව (........)

25. සංවර්ධන ව්‍යාපෘතියක් සිදු කිරීමට පෙර පරිසර බලපෑම් තක්සේරුකරණයක් (EIA) සිදුකරනු ලබන්නේ,

(1) ව්‍යාපෘතිය මගින් පරිසරයට වන ගැටලු හඳුනා ගැනීම සඳහා ය.

(2) ව්‍යාපෘතිය හරහා ලැබෙන සමාජ ආර්ථික ප්‍රතිලාභ හඳුනාගැනීම සඳහා ය.

(3) ව්‍යාපෘතිය හරහා පරිසරයට සිදුවන සෘණාත්මක බලපෑම් අවම කිරීම සඳහා ය.

(4) ව්‍යාපෘතිය හරහා භෞතික හා ජෛව පරිසරයට සිදුවන සෘණාත්මක බලපෑම් අවමකරණය සඳහා ය.

(5) ව්‍යාපෘතිය හරහා පරිසරයට වන ධනාත්මක බලපෑම් උපරිමකරණය හා සෘණාත්මක බලපෑම් අවමකරණය සඳහාය. (........)

26. ශ්‍රී ලංකාවේ අභ්‍යන්තර සංක්‍රමණය කෙරෙහි බලපාන ප්‍රධානතම හේතුව වන්නේ,

(1) රැකියාව (2) විවාහය (3) අවතැන්වීම

(4) සංවර්ධන ව්‍යාපෘති (5) අධ්‍යාපනය (........)

27. නාගරික ජනාවාස වර්ධන ධූරාවලිය නිවැරදි අනුපිළිවෙළින් දැක්වෙන වරණය තෝරන්න.

(1) නගරය, මහනගරය, පුරවරය, නගරයාය, නාගරික සමූහිතය

(2) නගරය, මහනගරය, නගරයාය, නාගරික සමූහිතය, පුරවරය

(3) නගරය, මහනගරය, නාගරික සමූහිතය, පුරවරය, නගරයාය

(4) නගරය, මහනගරය, නගරයාය, පුරවරය, නාගරික සමූහිතය

(5) නගරය, මහනගරය, පුරවරය, නාගරික සමූහිතය, නගරයාය (........)

28. යාබද ශ්‍රී ලංකා සිතියමේ 1, 2 හා 3 අංකවලින් දැක්වෙන විශේෂිත ආර්ථික මධ්‍යස්ථාන තුන පිළිවෙළින් දැක්වෙන වරණය කුමක් ද?




(1) කැප්පෙටිපොළ, දඹුල්ල, නාරාහේන්පිට

(2) නාරාහේන්පිට, වැලිසර, තඹුත්තේගම

(3) තඹුත්තේගම, දඹුල්ල, කැප්පෙටිපොළ

(4) වැලිසර, දඹුල්ල, නාරාහේන්පිට

(5) තඹුත්තේගම, කැප්පෙටිපොළ, දඹුල්ල (........)

29. ලෝකයේ ජෛවීය ගොවිතැනෙහි කලාපීය ව්‍යාප්තියේ වැඩිම ප්‍රතිශතයක් හිමිකරගෙන තිබෙන කලාපය වන්නේ,

(1) ඕෂනියාව (2) යුරෝපය (3) ලතින් ඇමරිකාව

(4) උතුරු ඇමරිකාව (5) ආසියාව (........)

30. කිතුල්ගල, ආරුගම්බේ හා ඇල්ල වැනි ප්‍රදේශ වඩාත් ප්‍රසිද්ධ වී තිබෙන සංචාරණ ප්‍රභේදය කුමක් ද?

(1) පාරිසරික සංචාරණය (2) සංස්කෘතික සංචාරණය

(3) ප්‍රතිමෝධක සංචාරණය (4) සෞන්දර්ය සංචාරණය

(5) වික්‍රමයන් ආශ්‍රිත සංචාරණය (........)

31. එක්සත් ජාතීන්ගේ ලෝක සංචාරණ සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ,

(1) ඩෙන්මාර්කයේ කොපන්හේගන් නගරයේ ය.

(2) ස්පාඤ්ඤයේ මැඩ්රිඩ් නගරයේ ය.

(3) ස්විස්ටර්ලන්තයේ ජිනීවා නගරයේ ය.

(4) ජර්මනියේ බර්ලින් නගරයේ ය.

(5) බෙල්ජියමේ බ්‍රසල්ස් නගරයේ ය. (........)

**32.** මාස්ට්‍රිච්ට් සම්මුතිය (Treaty of Maastricht) මගින් ස්ථාපිත කර තිබෙන ප්‍රාදේශීය සංවිධානය වන්නේ,

(1) සාර්ක් සංවිධානය (2) යුරෝපා සංගමය (3) බ්‍රික්ස් සංවිධානය

(4) ගැට් සංවිධානය (5) අග්නිදිග ආසියානු සංගමය (........)

**33.** කර්මාන්ත ස්ථානගතවීමේ මෑත කාලීන ප්‍රවණතාවක් **නොවන්නේ,**

(1) නිදහස්ව ස්ථානගත විය හැකි කර්මාන්ත වර්ධනය වීම.

(2) තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ බලපෑම මත ස්ථානගත වීම.

(3) අධි තාක්ෂණික කර්මාන්ත අමුද්‍රව්‍ය ආශ්‍රිතව ස්ථානගත වීම.

(4) පරිසර සංරක්ෂණ උපායමාර්ග ප්‍රමුඛ කරගෙන ස්ථානගත වීම.

(5) බහුජාතික සමාගම්වල තීරණ කර්මාන්ත ස්ථානගතවීමේ දී වඩාත් වැදගත් වී තිබීම. (........)

**34.** ශ්‍රී ලංකාවේ ධමනි මිනිරන් මිල දී ගන්නා ප්‍රධාන ගැනුම්කරුවා වන්නේ,

(1) ජපානය (2) චීනය (3) ඉන්දියාව

(4) ජර්මනිය (5) රුසියාව (........)

**35.** ශ්‍රී ලංකාවේ මුහුදු වැලි සමඟ මිශ්‍ර වී පවතින ඛනිජ වැලි නිධිවල අන්තර්ගත ප්‍රධාන ඛනිජ ද්‍රව්‍ය කුමක් ද?

(1) රූටයිල් (2) ඉල්මනයිට් (3) සර්කෝන්

(4) මොනසයිට් (5) සිලිමනයිට් (........)

**36.** කාර්යය සැලකිල්ලට ගැනීමේ දී මහනුවර නගරය අයත් වන්නේ,

(1) පරිපාලන නගර ගණයට (2) සංස්කෘතික නගර ගණයට

(3) ප්‍රතිමෝධක නගර ගණයට (4) නේවාසික නගර ගණයට

(5) විශ්වවිද්‍යාල නගර ගණයට (........)

**37.** ගැමි නාගරික ජනාවාසයක කැපී පෙනෙන ලක්ෂණයකි,

(1) ජන සංඛ්‍යාව සාපේක්ෂ වශයෙන් අඩු වීම.

(2) ප්‍රාථමික ආර්ථික කටයුතු බහුල වශයෙන් පැවතීම.

(3) ඉදිකළ ප්‍රදේශ සාපේක්ෂව අඩු වීම.

(4) ජන ඝනත්වය සාපේක්ෂව අධික වීම.

(5) උදේ වරුවේ ජනාවාසයෙන් පිටතට සංචලනය වීම. (........)

**38.** හරිත විප්ලවයේ දී පාරිසරික වශයෙන් ඇති වූ අහිතකර ප්‍රතිඵලයක් වන්නේ,

(1) මහජනතාවගේ සෞඛ්‍ය පිරිහීම.

(2) පාරම්පරික ඉඩම් අහිමි වී යාම.

(3) අතිරේක ආහාර වර්ග අහිමි වී යාම.

(4) ගොවීන් ණයගැතියන් බවට පත්වීම.

(5) ගොවීන් අතර දැඩි ආර්ථික විෂමතා ඇතිවීම. (........)

**39.** ලෝකයේ විශාලතම පැල්පත් ජනාවාස සංකේන්ද්‍රණය වන්නේ,

(1) ඉන්දියාවේ ධාරවී (2) පාකිස්ථානයේ ඕරන්ගි ටවුන්

(3) දකුණු අප්‍රිකාවේ කයෙලිට්සා (4) කෙන්යාවේ කිබේරා

(5) මෙක්සිකෝවේ සියුඩෑඩ් නේසා (........)

**40.** ලෝකයේ වැඩිම පිරිසක් කථා කරන භාෂා යුගල වන්නේ,

(1) චීන හා ස්පාඤ්ඤය (2) චීන හා ඉංග්‍රීසි (3) චීන හා අරාබි

(4) ඉංග්‍රීසි හා හින්දි (5) ඉංග්‍රීසි හා ස්පාඤ්ඤය (........)

**

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

# අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| භූගෝල විද්‍යාව I | 22 | S | I | 13 ශ්‍රේණිය |
|---|---|---|---|---|

**උපදෙස්:**

- **II** කොටසෙහි ප්‍රශ්න **දෙකට ම** පිළිතුරු සැපයිය යුතු ය.
- **III** කොටස ප්‍රශ්න **හතරකින්** සමන්විත වන අතර තෝරාගත් ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සැපයිය යුතු ය.
- මෙම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම සඳහා 1:50,000 මොනරාගල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ද ලෝක ආකෘති සිතියමක් ද ප්‍රස්තාර කඩදාසි දෙකක් ද ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක මායිම් සහිත සිතියමක් ද සපයනු ලැබේ.

## II කොටස

1. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශයට පත් කරන ලද 1:50,000 පරිමාණයේ මොනරාගල භූ ලක්ෂණ සිතියමෙන් කොටසක් ඔබට සපයා ඇත. එහි සමෝච්ච රේඛා අන්තරය **අඩි 100** කි. එම සිතියම පදනම් කර ගනිමින් පහත දැක්වෙන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

**සැලකිය යුතුයි:**

- **පිළිතුරු සිතියමෙහි ලිවිය යුතු නො වේ.**
- **ප්‍රශ්න අංකය** සහ අදාළ **උප කොටස්වල අංක** පිළිතුරු පත්‍රයේ පැහැදිලි ව සඳහන් කළ යුතු ය.
- සිතියම ඔබේ පිළිතුරු පත්‍රයට ඇමිණිය යුතු **නො වේ.**

(i) AB, CD සහ EF රේඛාවන් ඔස්සේ හඳුනාගත හැකි භූ විෂමතා ලක්ෂණ **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(ii) GH රේඛාව ඔස්සේ හඳුනාගත හැකි ජලවහන ලක්ෂණය නම් කරන්න. (ලකුණු 01 යි)

(iii) අංක 1 චතුරස්‍රය තුළ හඳුනාගත හැකි ජලවහන රටාව නම් කරන්න. (ලකුණු 01 යි)

(iv) අංක 2 චතුරස්‍රය තුළ දැක්වෙන රාජ්‍ය ආයතන **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(v) සිතියම් ප්‍රදේශයේ මධ්‍යම කොටසේ ජනාවාස ව්‍යාප්තිය සීමා වීම කෙරෙහි බලපා තිබෙන හේතු **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(vi) XY සම්බන්ධ කරන රේඛාව ඔස්සේ හරස් පැතිකඩක් (cross section) නිර්මාණය කරන්න. (මේ සඳහා ඔබ වෙත සපයා ඇති ප්‍රස්තාර කඩදාසියක් භාවිතා කරන්න. සිතියමේ සමෝච්ච රේඛා අන්තරය අඩි 100 බව සලකන්න) (ලකුණු 05 යි)

(vii) සිතියම් ප්‍රදේශයේ භූ විෂමතා ලක්ෂණ පහත සඳහන් සංස්කෘතික ලක්ෂණ තීරණය වීමේ දී බලපෑ ඇති ආකාරය පැහැදිලි කරන්න.
(a) මාර්ග ව්‍යාප්තිය
(b) කෘෂිකාර්මික භූමි පරිභෝග ව්‍යාප්තිය (ලකුණු 06 යි)

2. ඔබ වෙත සපයා ඇති ලෝක ආකෘති සිතියමෙහි සම්මත සංකේත හා වර්ණ යොදාගනිමින් පහත සඳහන් දෑ **ලකුණු** කර **නම්** කරන්න.

- පැරිස්
- පැපුවා නිව්ගිනියා දූපත
- නයගරා දිය ඇල්ල
- බිස්කේ බොක්ක
- කර්කටක නිවර්තනය
- එක්සත් ජාතීන්ගේ පරිසර වැඩසටහනේ මූලස්ථානය පිහිටි නගරය
- ලතින් ඇමරිකානු කලාපයේ ඉහළම නාගරීකරණයක් සහිත රට
- අයර් විල
- ගෝබි කාන්තාරය
- බෙංගුවෙලා ප්‍රවාහය

(ලකුණු 10 යි)

අටවැනි පිටුව බලන්න

## III කොටස

3. (i) දත්ත හා තොරතුරු අතර පවතින වෙනස කුමක් ද? (ලකුණු 02 යි)

(ii) භූගෝල විද්‍යාවේ දී මිනුම් ආශ්‍රිත දත්ත රැස් කිරීමට භාවිතා කරන උපකරණ හයක් පහත රූප සටහන්වල දැක්වේ. එම උපකරණ අක්ෂර අනුපිළිවෙලින් නම් කරන්න. (ලකුණු 03 යි)


A


B


C


D


E


F

(iii) සංගහනය හා නියැදිය අතර වෙනස නිදසුන් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(iv) භූගෝල විද්‍යාව හදාරන ශිෂ්‍යයෙක් තම පර්යේෂණයක් සඳහා නියැදියකින් දත්ත රැස් කිරීමේ දී ප්‍රශ්නාවලියක් ඒ සඳහා සකස් කිරීමට තීරණය කරන ලදී.

(a) මෙම ශිෂ්‍යයා ප්‍රශ්නාවලිය සැකසීමේ දී එහි ගුණාත්මකභාවය වැඩිකර ගැනීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **දෙකක්** ලියා දක්වන්න.

(b) ප්‍රශ්නාවලියක් හරහා දත්ත රැස්කිරීමේ පවතින වාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(c) ප්‍රශ්නාවලියක් හරහා දත්ත රැස් කිරීමේ පවතින අවාසි **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06 යි)

4. 2011 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා කටුගස්තොට කාලගුණ විද්‍යා මධ්‍යස්ථානයෙන් වාර්තා වූ වාර්ෂික මුළු වර්ෂාපතන අගයන් වගුව 1 හි දැක්වේ.

**වගුව 1 - කටුගස්තොට මුළු වාර්ෂික වර්ෂාපතනය (2011-2020)**

| වර්ෂය | වර්ෂාපතනය (mm) |
|---|---|
| 2011 | 1776 |
| 2012 | 1991 |
| 2013 | 1925 |
| 2014 | 2539 |
| 2015 | 1976 |
| 2016 | 1300 |
| 2017 | 1565 |
| 2018 | 2029 |
| 2019 | 1543 |
| 2020 | 1496 |

මූලාශ්‍රය : සංඛ්‍යාන නිබන්ධනය, 2022

(i) වගුව 1 හි දත්ත භාවිතා කරමින් 2011-2020 කාලයට අදාළව කටුගස්තොට වර්ෂාපතනය සම්බන්ධයෙන් පහත සඳහන් දෑ ගණනය කරන්න.

(a) මධ්‍යන්‍යය (c) අපගමනය

(b) මධ්‍යස්ථය (d) මධ්‍යන්‍යය අපගමනය (ලකුණු 07 යි)

(ii) ඉහත (i) c කොටස යටතේ ඔබ විසින් ගණනය කරන ලද අපගමන අගයන් නිරූපණය කිරීම සඳහා අපගමන තීරු ප්‍රස්තාරයක් නිර්මාණය කරන්න.
(මේ සඳහා සපයා ඇති ප්‍රස්තාර කඩදාසියක් භාවිතා කරන්න.) (ලකුණු 05 යි)

(iii) ඔබ විසින් නිර්මාණය කරන ලද අපගමන ප්‍රස්තාරය භාවිතයෙන් කටුගස්තොට වර්ෂාපතනය පිළිබඳව හඳුනාගත හැකි ලක්ෂණ **තුනක්** ලියා දක්වන්න. (ලකුණු 03 යි)

5. (i) දුරස්ථ සංවේදය යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ප්‍රධාන දුරස්ථ සංවේද වේදිකාව වර්ග **තුන** නම් කරන්න. (ලකුණු 03 යි)

(iii) දුරස්ථ සංවේද ක්‍රියාවලිය හරහා දත්ත රැස්කිරීමට බහුල වශයෙන් භාවිතා කරන පහත දැක්වෙන තාක්ෂණික ක්‍රමවේද **දෙක** විස්තර කරන්න.

(a) ගුවන් ඡායාරූප තාක්ෂණය

(b) චන්ද්‍රිකා ඡායාරූප තාක්ෂණය (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාව තුළ දුරස්ථ සංවේද ශිල්ප ක්‍රම ප්‍රායෝගිකව භාවිතා කිරීමේ දී මුහුණපෑමට සිදුවන සංරෝධක **දෙකක්** පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

6. 2021/2022 මහ කන්නයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව වී නිෂ්පාදනය මෙට්‍රික් ටොන් වලින් වගුව 2 හි දැක්වේ.

**වගුව 2 : 2021/2022 මහ කන්නයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)**

| අනු අංකය | දිස්ත්‍රික්කය | වී නිෂ්පාදනය | අනු අංකය | දිස්ත්‍රික්කය | වී නිෂ්පාදනය |
|---|---|---|---|---|---|
| 01 | කොළඹ | 8166 | 14 | කිලිනොච්චිය | 60417 |
| 02 | ගම්පහ | 27059 | 15 | මඩකලපුව | 96253 |
| 03 | කළුතර | 27349 | 16 | අම්පාර | 221529 |
| 04 | මහනුවර | 31211 | 17 | ත්‍රිකුණාමලය | 98005 |
| 05 | මාතලේ | 59812 | 18 | කුරුණෑගල | 260302 |
| 06 | නුවරඑළිය | 11126 | 19 | පුත්තලම | 39985 |
| 07 | ගාල්ල | 21486 | 20 | අනුරාධපුරය | 260448 |
| 08 | මාතර | 28761 | 21 | පොළොන්නරුව | 182628 |
| 09 | හම්බන්තොට | 124870 | 22 | බදුල්ල | 62221 |
| 10 | යාපනය | 15013 | 23 | මොනරාගල | 100062 |
| 11 | මන්නාරම | 51276 | 24 | රත්නපුරය | 37299 |
| 12 | වව්නියාව | 42222 | 25 | කෑගල්ල | 20620 |
| 13 | මුලතිව් | 43110 | | | |

මූලාශ්‍රය : ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2023

(i) ඉහත දත්ත පදනම් කරගෙන පන්ති ප්‍රාන්තර, ප්‍රගණන ලකුණු හා දිස්ත්‍රික් නාම ඇතුළත් වගුවක් සකස් කරන්න. වගුව පහත සඳහන් ආකාරයට සකස් විය යුතුය.

- පන්ති සංඛ්‍යාව 5 කට සීමා විය යුතුය.
- පළමු පන්තියේ ආරම්භක අගය ශූන්‍ය විය යුතුය.
- පන්ති ප්‍රාන්තරය 60000 ලෙස සලකන්න. (ලකුණු 04 යි)

(ii) ඉහත (i) හි ඔබ සකස් කළ වගුව හා සපයා ඇති ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් මායිම් දැක්වෙන සිතියම පදනම් කර ගනිමින් වර්ණාංකිත සිතියමක් නිර්මාණය කරන්න. (ලකුණු 06 යි)

(iii) ඔබ නිර්මාණය කළ වර්ණාංකිත සිතියම ඇසුරින් හඳුනාගත හැකි මහ කන්නයේ වී නිෂ්පාදනයෙහි කැපී පෙනෙන ලක්ෂණ **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 03 යි)

(iv) වර්ණාංකිත සිතියමක පවතින අවාසි **දෙකක්** කෙටියෙන් ලියා දක්වන්න. (ලකුණු 02 යි)

***




SCALE 1: 50,000

N

සියලු ම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது/ All Rights Reserved

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மத்திய மாகாண கல்வித் திணைக்களம்
DEPARTMENT OF EDUCATION - CENTRAL PROVINCE

## අ.පො.ස (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

| භූගෝල විද්‍යාව II | 22 | S | II | 13 ශ්‍රේණිය |
|---|---|---|---|---|

| පැය තුනයි | අමතර කියවීම් කාලය - මිනිත්තු 10 |
|---|---|

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

**උපදෙස්:**

- එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙකක්වත්** තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස - භෞතික භූගෝල විද්‍යාව

**1.** (i) පතන ශීඝ්‍රතාවයේ ප්‍රභේද **දෙකක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) දේශගුණ පාලන සාධක **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශ්‍රී ලංකාවේ පහත දැක්වෙන වර්ෂාපතන වර්ගවල සම්භවය සිදුවන ආකාරය හා වර්ෂාපතනයේ භූගෝලීය ව්‍යාප්ති රටාව පැහැදිලි කරන්න.

(a) නිරිත දිග මෝසම

(b) ඊසාන දිග මෝසම (ලකුණු 06 යි)

(iv) දේශගුණ වෙනස්වීම් අවම කිරීමට ශ්‍රී ලංකාව ගෙන තිබෙන ක්‍රියාමාර්ග **තුනක්** විමසන්න. (ලකුණු 06 යි)

**2.** (i) පහත සිතියමේ A හා B අක්ෂර වලින් දැක්වෙන යමහල් කලාප **දෙක** නම් කරන්න. (ලකුණු 02 යි)




(ii) ආක්‍රාන්ත යමහල් භූ රූප **දෙකක** සහ නිෂ්ක්‍රාන්ත යමහල් භූ රූප **දෙකක** කැපීපෙනෙන භෞතික ලක්ෂණ හා නිර්මාණ ක්‍රියාවලිය උචිත රූප සටහන් ආධාරයෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) යමහල් ක්‍රියාකාරිත්වය හරහා භෞතික පරිසරයට සිදුවන හානි **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) යමහල් ක්‍රියාකාරිත්වය ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

3\. (i) පහත A හා B පින්තූරවලින් දැක්වෙන බියෝම් **දෙවර්ගය** නම් කරන්න. (ලකුණු 02 යි)







(ii) A ලෙස හඳුනාගත් බියෝමය පිළිබඳව පහත දැක්වෙන මාතෘකා ඔස්සේ විස්තර කරන්න.
(a) ව්‍යාප්තිය
(b) දේශගුණය
(c) වෘක්ෂලතා ලක්ෂණ (ලකුණු 06 යි)

(iii) B ලෙස හඳුනාගත් බියෝමය ආශ්‍රිත දේශගුණයට ජෛව ප්‍රජාව අනුවර්තනය වී ඇති ආකාරය පහත දැක්වෙන මාතෘකා ඔස්සේ පැහැදිලි කරන්න.
(a) ශාක දක්වන අනුවර්තනය වීම්
(b) සතුන් දක්වන අනුවර්තනය වීම් (ලකුණු 06 යි)

(iv) මානුෂ ක්‍රියාකාරකම් නිසා වර්තමානයේ බියෝම මුහුණ දෙන ගැටලු **තුනක්** විස්තර කරන්න. (ලකුණු 06 යි)

4\. (i) ශ්‍රී ලංකාවේ බහුලව ජල ගැලීම් සිදුවන තෙත් කලාපීය ගංගා නිම්න **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ජල ගැලීම් ආපදාව උග්‍රවීම කෙරෙහි හේතුවන මානුෂ ක්‍රියාකාරකම් **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ජලගැලීම් කළමනාකරණයේ දී ආපදා කළමනාකරණ චක්‍රයේ පහත සඳහන් අවස්ථාවල දී ගතයුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරන්න.
(a) ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව
(b) අවම කිරීමේ අවස්ථාව (ලකුණු 06 යි)

(iv) ශ්‍රී ලංකාවේ ආපදා කළමනාකරණ ක්‍රියාවලියට අදාළව පහත සඳහන් ආයතනවලින් ඉටුවන කාර්යභාරය කෙටියෙන් විස්තර කරන්න.
(a) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව
(b) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (ලකුණු 06 යි)

## II කොටස - මානුෂ භූගෝල විද්‍යාව

5\. (i) නාගරීකරණ දර්ශකය යනු කුමක් ද? (ලකුණු 02 යි)

(ii) ලෝක නාගරීකරණය ආශ්‍රිත ප්‍රවණතා **තුනක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(iii) ලෝක නාගරීකරණය ආශ්‍රිත සමාජ ආර්ථික ගැටලු **දෙකක්** සහ පාරිසරික ගැටලු **දෙකක්** වෙන්ව කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) නාගරීකරණය ආශ්‍රිත ගැටලු විසඳීම සඳහා ශ්‍රී ලංකාව මෑත කාලයේ ගෙන ඇති ක්‍රියාමාර්ග **තුනක්** විවේචනාත්මකව පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

6\. (i) නිෂ්පාදන කර්මාන්ත ස්ථානගත වීම කෙරෙහි බලපාන සාධක **හතරක්** නම් කරන්න. (ලකුණු 02 යි)

(ii) ශ්‍රී ලංකාවේ පහත සඳහන් කර්මාන්ත ස්ථානගතවීම කෙරෙහි බලපා තිබෙන සාධක කෙටියෙන් පැහැදිලි කරන්න.
(a) සීනි කර්මාන්තය
(b) සිමෙන්ති කර්මාන්තය (ලකුණු 06 යි)

(iii) සීනි කර්මාන්තය ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට දායක වන ආකාර **තුනක්** කෙටියෙන් පරීක්ෂා කරන්න. (ලකුණු 06 යි)

(iv) කාර්මික අංශය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන තිබෙන ක්‍රියාමාර්ග **තුනක්** විමසන්න. (ලකුණු 06 යි)

**7.** 1950 සිට 2050 (ප්‍රක්ෂේපිත) දක්වා කාල පරිච්ඡේදය තුළ දී ලෝකයේ තෝරාගත් රටවල් කිපයක දළ උපත් අනුපාතිකය පිළිබඳ දත්ත වගුව 1 හි දක්වා ඇත.

**වගුව 1 - ලෝකයේ තෝරාගත් රටවල් කිපයක දළ උපත් අනුපාතිකය**

| රට | 1950 | 1975 | 2000 | 2025 | 2050 |
|---|---|---|---|---|---|
| ඇමරිකා එක්සත් ජනපදය | 22.8 | 14.5 | 14.5 | 11.0 | 9.9 |
| කැනඩාව | 26.8 | 15.5 | 10.6 | 9.9 | 9.0 |
| ඕස්ට්‍රේලියාව | 23.3 | 16.8 | 13.1 | 11.3 | 9.9 |
| ජපානය | 28.3 | 17.4 | 9.6 | 6.7 | 6.8 |
| චීනය | 41.0 | 25.1 | 13.8 | 7.3 | 6.9 |
| ශ්‍රී ලංකාව | 35.9 | 27.9 | 18.2 | 13.4 | 10.6 |
| බංග්ලාදේශය | 46.5 | 46.2 | 29.0 | 16.8 | 11.6 |
| නයිජීරියාව | 45.6 | 48.1 | 43.5 | 35.5 | 24.5 |
| ඉතියෝපියාව | 49.4 | 49.6 | 44.5 | 30.2 | 20.7 |
| දකුණු සුඩානය | 46.2 | 51.4 | 51.4 | 29.0 | 21.6 |

මූලාශ්‍රය : *United Nations, Population Division, World Population Prospects, 2022*

(i) දළ උපත් අනුපාතිකය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 02 යි)

(ii) වගුව 1 හි අඩංගු දත්ත ඇසුරින්, දළ උපත් අනුපාතිකයේ අවකාශීය හා කාලීන වශයෙන් කැපී පෙනෙන ලක්ෂණ **හතරක්** සඳහන් කරන්න. (ලකුණු 04 යි)

(iii) ලෝකයේ සෙසු කලාපවලට සාපේක්ෂව අප්‍රිකානු කලාපීය රටවල දළ උපත් අනුපාතිකය පෙන්නුම් කරන අවකාශීය වෙනස කෙරෙහි හේතු වී තිබෙන සාධක **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iv) (a) ඉහත වගුවේ දත්තවලට අනුව සංවර්ධිත රටවල දළ උපත් අනුපාතිකය කාලීන වශයෙන් පිළිබිඹු කරන ප්‍රවණතාව කෙරෙහි බලපා තිබෙන හේතු සාධක **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

(b) මෙම ප්‍රවණතාව නිසා සංවර්ධිත රටවලට අනාගතයේ මුහුණපෑමට සිදුවන අභියෝග **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**8.** "ගෝලීයකරණය වේගවත් වීම කෙරෙහි බහුජාතික සමාගම් සහ තොරතුරු සන්නිවේදන තාක්ෂණය යන වාහක ඉවහල් වී තිබේ".

(i) බහුජාතික සමාගමක් සතු ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න. (ලකුණු 02 යි)

(ii) බහුජාතික සමාගම් සංවර්ධනය වෙමින් පවතින රටවල ආයෝජන සිදුකිරීම කෙරෙහි බලපා තිබෙන හේතු **තුනක්** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) තොරතුරු සන්නිවේදන තාක්ෂණය ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනයට දායක වී ඇති ආකාරය පහත සඳහන් මාතෘකා යටතේ පැහැදිලි කරන්න.

(a) අධ්‍යාපනය හා සෞඛ්‍යය

(b) බැංකු හා මූල්‍ය කටයුතු (ලකුණු 06 යි)

(iv) ඉහත සඳහන් ගෝලීයකරණ වාහකයන්ගේ බලපෑම නිසා සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණපාන ගැටලු **තුනක්** සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

***

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

අ.පො.ස. (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය - 2024

13 ශ්‍රේණිය | භූගෝල විද්‍යාව I | ලකුණු දීමේ පටිපාටිය

I කොටස

| ප්‍රශ්න අංකය | පිළිතුර | ප්‍රශ්න අංකය | පිළිතුර |
|---|---|---|---|
| 01 | 3 | 21 | 3 |
| 02 | 2 | 22 | 3 |
| 03 | 3 | 23 | 1 |
| 04 | 1 | 24 | 2 |
| 05 | 5 | 25 | 5 |
| 06 | 3 | 26 | 2 |
| 07 | 4 | 27 | 5 |
| 08 | 3 | 28 | 3 |
| 09 | 4 | 29 | 1 |
| 10 | 2 | 30 | 5 |
| 11 | 2 | 31 | 2 |
| 12 | 2 | 32 | 2 |
| 13 | 4 | 33 | 3 |
| 14 | 2 | 34 | 1 |
| 15 | 4 | 35 | 2 |
| 16 | 3 | 36 | 2 |
| 17 | 1 | 37 | 5 |
| 18 | 1 | 38 | 3 |
| 19 | 3 | 39 | 2 |
| 20 | 4 | 40 | 1 |

(ලකුණු 01 x 40 = 40 යි)

II කොටස

1. (i) AB - කෙරැව

CD - නිම්නය

EF - අවතල බෑවුම (ලකුණු 01 x 03 = 03)

(ii) දියඇල්ල (ලකුණු 01)

(iii) ශාඛීය ජලවහන රටාව (ලකුණු 01)

(iv)
- පාසල
- රෝහල
- තැපැල් කාර්යාලය
- දිසා වන කාර්යාලය
- අධ්‍යාපන කාර්යාලය
- ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
- බස් ඩිපෝව
- කච්චේරි නිවස (ලකුණු 0.5 x 04 = 02)

(v)
- කඳුකර හා විෂමතා ලක්ෂණ පැවතීම.
- වනාන්තර හා ලඳු කැලෑ ව්‍යාප්තව තිබීම.
- ප්‍රවාහන සුගමතාව අවම වීම.
- පොදු පහසුකම් සපයන සේවා ස්ථාන නොතිබීම.

(ලකුණු 01 x 02 = 02)

(vi)




- X අන්තය ඇඳීම - 01
- Y අන්තය ඇඳීම - 01
- හරස්කඩ ඇඳීම - 2.5
- පරිමාණය සටහන් කිරීම - 0.5

} එකතුව 05

## III කොටස

3. (i) නිරීක්ෂණය හෝ විශ්ලේෂණය සඳහා හෝ රැස් කළ කරුණු හා සංඛ්‍යා දත්ත ලෙස හැඳින්වේ. දත්ත යනු සංවිධානය හා සකස් කොට නොමැති දළ කරුණු ය. ඒවා සංවිධානය කොට සකස් කිරීමෙන් පසුව අර්ථාන්විත හා ප්‍රයෝජනවත් ලෙස ඉදිරිපත් කිරීමෙන් තොරතුරු බවට පත් වේ. ඒ අනුව තොරතුරු නිර්මාණය වන්නේ දත්ත වලිනි.

(ලකුණු 02)

(ii) A - අනිලමානය

B - මාලිමාව

C - තියොඩලයිට්ටුව

D - ආකර්ෂණ මාපකය

E - වර්ෂාමානය

F - තෙත් හා වියළි බල්බ උෂ්ණත්වමානය

(ලකුණු 0.5 × 06 = 03)

(iii) • සංගහනය යනු තොරතුරු රැස් කිරීමට අදාළ වූ ඒකක සමූහයයි. එනම් අපේක්ෂිත අධ්‍යයනයට අයත් සමස්තයයි.

• සමස්ත සංගහනය නියෝජනය වන පරිදි තෝරා ගන්නා කොටස නියැදිය වශයෙන් හඳුන්වයි.

(නිදසුන් ඉදිරිපත් කරමින් වෙනස පැහැදිලි කර තිබිය යුතුයි.)

(ලකුණු 02 × 02 = 04)

(iv) (a) • ප්‍රශ්න කෙටි විය යුතුයි.

• ප්‍රශ්න සරල විය යුතුයි.

• ප්‍රශ්න තේරුම් ගැනීමට පහසු විය යුතුයි.

(b) • මහා පරිමාණයෙන් දත්ත රැස් කිරීමට හැකිවීම.

• නිර්නාමිකභාවය හා රහස්‍යභාවයක් තිබීම.

• පිරිවැය අඩු වීම / කාලය ඉතිරිකර ගත හැකිවීම.

• ප්‍රමාණාත්මක හා ගුණාත්මක දත්ත එකවර ලැබීම.

• ප්‍රමිතිගත ප්‍රතිචාර ලැබීම.

(c) • තොරතුරු වල ගැඹුර සීමිත වීම.

• ප්‍රතිචාර පක්ෂග්‍රාහී වීම.

• ප්‍රශ්න වැරදි ලෙස තේරුම් ගැනීම.

• තොරතුරු පැහැදිලි කිරීම සඳහා දක්ෂතාවක් නොමැති වීම.

• සූක්ෂම තොරතුරු ග්‍රහණය කර ගැනීමට පවතින දුෂ්කරතා.

(ලකුණු 02+02+02=06)

4.(i) (a) $\bar{x} = \frac{\Sigma x}{n}$

$\bar{x} = \frac{18140}{10}$

$\bar{x} = \underline{1814 \text{ mm}}$ (ලකුණු 01)

(b) • දත්ත ආරෝහණ පටිපාටියට සැකසීම

1300, 1496, 1543, 1565, 1776, 1925, 1976,

1991, 2029, 2539

• $Mdn = \frac{N+1}{2}$

$= \frac{10+1}{2}$

$= \frac{11}{2}$

= 5.5 වැනි ස්ථානය

$\therefore Mdn = \frac{1776+1925}{2}$

$= \frac{3701}{2}$

$= \underline{\underline{1850.5 \text{ mm}}}$ (ලකුණු 02)

(C)

| වර්ෂය | $x$ | $\bar{x}$ | $(x-\bar{x})$ |
|---|---|---|---|
| 2011 | 1776 | 1814 | -38 |
| 2012 | 1991 | 1814 | 177 |
| 2013 | 1925 | 1814 | 111 |
| 2014 | 2539 | 1814 | 725 |
| 2015 | 1976 | 1814 | 162 |
| 2016 | 1300 | 1814 | -514 |
| 2017 | 1565 | 1814 | -249 |
| 2018 | 2029 | 1814 | 215 |

(b) චන්ද්‍රිකා ඡායාරූප තාක්ෂණය

- මිනිසා විසින් නිර්මාණය කරන ලද චන්ද්‍රිකා මත රඳවා ඇති සංවේදන උපකරණ ආධාරයෙන් භූමියෙහි පවතින තොරතුරු ග්‍රහණය කොට එවා පෘථිවියේ විවිධ ස්ථානවල පිහිටුවා ඇති ග්‍රාහක වෙත අංකිත දත්ත ලෙසයෙන් යොමු කිරීමේ ක්‍රියාවලිය චන්ද්‍රිකා තාක්ෂණය ලෙස හඳුන්වයි.
- චන්ද්‍රිකා ප්‍රධාන වර්ග දෙකකි.
  - * භූ ස්ථාවර (භූ සමකාලීන) චන්ද්‍රිකා
  - * ධ්‍රැවක කක්ෂ චන්ද්‍රිකා

(මේ අතර වෙනස පැහැදිලි කළ යුතුයි)

(ලකුණු 03 යි)

(iv)
- චන්ද්‍රිකා දත්ත මිල දී ගත යුතු වීම හා මිල අධික වීම.
- චන්ද්‍රිකා දත්ත භාවිතයට ප්‍රමාණවත් තාක්ෂණික දැනුමක් පැවතිය යුතු වීම.
- අන්තර්ජාල පහසුකම් තිබිය යුතු වීම.
- දත්ත හැසිරවීම සඳහා වැඩි දත්ත ප්‍රමාණයක් ගබඩා කළ හැකි ධාරිතාවක් සහිත පරිගණක අවශ්‍ය වීම.
- දත්ත විශ්ලේෂණය සඳහා සුවිශේෂිත වූ මෘදුකාංග අවශ්‍ය වීම.
- ත්වේනුයේ පවතින කුඩා රූපමිතීන් ආශ්‍රිත දත්ත ග්‍රහණය කිරීමේ දී බුවත් වී යාමේ දෝෂ පැවතීම.

(ලකුණු 02 × 02 = 04)

6. (i)

| පන්ති ප්‍රාන්තර | ප්‍රගණන ලකුණු | දිස්ත්‍රික් නාම |
|---|---|---|
| 0 - 59 999 | 卌 卌 卌 | කොළඹ, ගම්පහ, කළුතර, මහනුවර, මාතලේ, නුවරඑළිය, ගාල්ල, මාතර, යාපනය, මන්නාරම, වව්නියාව, මුලතිව්, පුත්තලම, රත්නපුරය, කෑගල්ල |
| 60 000 - 119 999 | 卌 | කිලිනොච්චිය, මඩකලපුව, ත්‍රිකුණාමලය, බදුල්ල, මොනරාගල |
| 120 000 - 179 999 | / | හම්බන්තොට |
| 180 000 - 239 999 | // | අම්පාර, පොළොන්නරුව |
| 240 000 - 299 999 | // | කුරුණෑගල, අනුරාධපුරය |

* 2023 (2024) උසස් පෙළ විභාගයේ දී මෙහි දැක්වෙන ක්‍රමයට අමතරව තවත් ක්‍රම දෙකකට පන්ති ප්‍රාන්තර නිර්මාණය කර ඇත්නම් ලකුණු ලබා දෙන ලදී. මෙහිදී ද එම ක්‍රමයකට පන්ති ප්‍රාන්තර නිර්මාණය කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ii)
- මාතෘකාව - 0.5
- මූලාශ්‍රය - 0.5
- සූචකය - 02
- දිස්ත්‍රික්ක නිවැරදිව ඡායා කිරීම - 03

} එකතුව 06

(iii)
- තෙත් කලාපීය දිස්ත්‍රික්ක වලින් අඩු වී නිෂ්පාදනයක් වාර්තා වීම.
- වියළි කලාපීය දිස්ත්‍රික්ක වලින් සාපේක්ෂ වශයෙන් වැඩි වී නිෂ්පාදනයක් වාර්තා වීම.
- වැඩිම වී නිෂ්පාදනය අනුරාධපුරය හා කුරුණෑගල දිස්ත්‍රික්ක වලින් වාර්තා වීම.
- දෙවැනියට වැඩිම වී නිෂ්පාදනයක් පොළොන්නරුව හා අම්පාර

I කොටස

භෞතික භූගෝල විද්‍යාව

1. (i) • පරිසර පතන ශීඝ්‍රතාව
• වියළි පතන ශීඝ්‍රතාව (වියළි ස්ථිරතාපී පතන ශීඝ්‍රතාව)
• තෙත් පතන ශීඝ්‍රතාව (තෙත් ස්ථිරතාපී පතන ශීඝ්‍රතාව)

(ලකුණු 01 × 02 = 02)

(ii) • සූර්ය විකිරණ තීව්‍රතාව
• අක්ෂාංශ අනුව සූර්ය විකිරණයේ ඇති වන වෙනස
• සාගර හා ගොඩබිම් ව්‍යාප්තිය
• සාගර ප්‍රවාහ (දියවැල්)
• කඳු බාධක
• අඩු පීඩන හා වැඩි පීඩන පද්ධතිවල පිහිටීම.

(ලකුණු 02 × 02 = 06)

(iii) (a) නිරිත දිග මෝසම
• සර්සභවය - අන්තර් නිවර්තන අභිසරණ කලාපය (ITCZ) දිවයිනට උතුරින් පිහිටා තිබීම නිසා නිරිත දිග මෝසම සර්සභවය ලබන ආකාරය ලියා තිබිය යුතුයි.
• වර්ෂාපතනයේ භූගෝලීය ව්‍යාප්තිය -
* මධ්‍යම කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශයට අධික වර්ෂාපතනයක් ලැබේ.
* වියළි කලාපීය ප්‍රදේශයට අඩු වර්ෂාපතනයක් ලැබේ.
* මධ්‍යම කඳුකරයේ නැගෙනහිර බෑවුම ඔස්සේ ජල වාෂ්ප රහිත වියළි සුළං ප්‍රවාහ හමායයි.

(b) ඊසාන දිග මෝසම
• සර්සභවය - අන්තර් නිවර්තන අභිසරණ කලාපය (ITCZ) දිවයිනට දකුණින් පිහිටීම නිසා ඊසාන දිග මෝසම සර්සභවය ලබන ආකාරය ලියා තිබිය යුතුයි.

• වර්ෂාපතනයේ භූගෝලීය ව්‍යාප්තිය -

• දිවයිනේ උතුරු - නැගෙනහිර ප්‍රදේශයට වැඩි වර්ෂාපතනයක් ලැබේ.

• මධ්‍යම කඳුකරයේ ඊසාන බෑවුම් ප්‍රදේශයට වර්ෂාපතනය අධිකව ලැබේ.

• තෙත් කලාපයට සාපේක්ෂ වශයෙන් අඩු වර්ෂාපතනයක් ලැබේ.

(ලකුණු 03 + 03 = 06)

(iv) • වාහනවල දුම් පරීක්ෂණය පිළිබඳ ප්‍රතිපත්ති හා නව නීති ක්‍රියාත්මක කිරීම.

• පරිසර හිතකාමී මෝටර් රථ හඳුන්වා දීම.

• වන සංරක්ෂණය.

• නැවත වන වගාව.

• පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

• ජාතික කාබන් අරමුදල ස්ථාපිත කිරීම සහ ජගත් විමෝචන ඒකකය පිහිටුවීම.

• රසායනික පොහොර භාවිතය සීමා කිරීම.

• දේශගුණ විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය ස්ථාපිත කිරීම.

• 1993 වර්ෂයේ සිටම ශ්‍රී ලංකාව දේශගුණ විපර්යාස පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතියේ පාර්ශවකරුවෙක් වීම.

(ලකුණු 02 × 03 = 06)

2. (i) A - මධ්‍යධරණී - හිමාලයානු කලාපය

B - පැසිපික් ගිනි වළල්ල

(ලකුණු 01 × 02 = 02)

(ii) <u>ආක්‍රාන්ත යමහල් භූරූප</u>

• ඩයික

• ආස්තර

• ලැකොලිත

• සිමර්ගේ ලැකොලිත

• ලොපොලිත (තලිසෙල)

• ෆැකොලිත

- සතුන් ගුල් හාරාගෙන ජීවත් වීම.
- බොහෝ සතුන් නිශාචර වීම.
- සැතල උෂ්ණත්වයෙන් ආරක්ෂා වීම සඳහා සමහර පක්ෂීන් 300m තරම් උසින් පියාසර කිරීම.
- පුළල් කොර්ට සහිත පාද, ඝන ඇසිපිය, රළු හොල් පිහිටා තිබීම. (ඔටුවා)

(ලකුණු 01 × 03 = 03)

(iv)
- වන හරණය
- කාන්තාරීකරණය
- කෘෂි රසායනික භාවිතය නිසා ජලජ බියෝම වලට හානි සිදුවීම.
- කර්මාන්ත නිසා සිදුවන වායු දූෂණය බියෝම කෙරෙහි අහිතකරව බලපෑම.
- ඛනිජ තෙල් හැලීමෙන් ජලජ බියෝම වලට හානි සිදුවීම.
- සංවර්ධන ව්‍යාපෘති නිසා බියෝම වලට හානි සිදුවීම.

(ලකුණු 02 × 03 = 06)

4.(i)
- කළු ගඟ
- කැලණි ගඟ
- නිල්වලා ගඟ
- ගිං ගඟ
- අත්තනගලු ඔය (ලකුණු 0.5 × 04 = 02)

(ii)
- ගංගා ආශ්‍රිත පහත් බිම් ගොඩ කිරීම.
- දරිද්‍රතාවය
- අනවසර ඉදිකිරීම්
- උපද්‍රවය පිළිබඳ නොදැනුවත් භාවය
- අනවසරයෙන් වැලි ගොඩ දැමීම.

(ලකුණු 02 × 03 = 06)

(iii) (a) ප්‍රතිචාර දැක්වීමේ අවස්ථාව
- අනතුරු ඇඟවීම.
- ගංවතුරට හසු වූ පුද්ගලයින් මුදා ගැනීම
- ආරක්ෂාව සහතික කිරීම.
- අසරණ පුද්ගලයින්ට වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම.
- ජනතාවට තාවකාලික නිවාස හා ආහාර පාන සැපයීම.

• අලාභ හානි තක්සේරු කර ගැනීම

(ලකුණු 01 x 03 = 03)

(b) අවම කිරීමේ අවස්ථාව

• පූර්ව සූදානම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
• ගංවතුර පාලක බැමි ඉදිකිරීම.
• ජනතාව දැනුවත් කිරීම.
• ප්‍රජා සහභාගීත්වය
• අනතුරු ඇඟවීමේ පද්ධති සවි කිරීම.
• ආයතනික ශක්තිමත් භාවය ඇති කිරීම.

(ලකුණු 01 x 03 = 03)

(iv) (a) කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව

• සුනාමි, සුළිසුළං, කුණාටු, මුහුද ගොඩගැලීම ආදී උපද්‍රව පිළිබඳ තොරතුරු හැකි ඉක්මනින් ලබා ගැනීම හා පුරෝකථනය කිරීම.
• ආපදා අවස්ථාව පිළිබඳව පූර්ව දැනුම් දීම.
• පැය 24 පුරා සක්‍රීය සේවා ලබා ගැනීම.

(ලකුණු 01 x 03 = 03)

(b) ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය

• නාය යෑම් අධ්‍යනය.
• නාය යෑම් කලාප සිතියම්ගත කිරීම
• නාය යෑමට ලක් වූ කඳු නැවත ස්ථායීකරණය
• නාය යෑම් පිළිබඳව පූර්ව අනතුරු ඇඟවීම.
• ඉදිකිරීම් අධීක්ෂණය.

(ලකුණු 01 x 03 = 03)

(iii) • ප්‍රාදේශීය සංවර්ධනය වේගවත් වීම.
• නව රැකියා උත්පාදනය
• සීනි ආනයනය සඳහා වැයවන මුදල් ඉතිරි වීම.
• එතනෝල් වැනි අතුරු නිෂ්පාදන බිහිවීම.
• උක් වගා කරන විශාල ගොවීන් ප්‍රමාණයකට ආදායම් මාර්ග ලබාදීමට දායක වීම.

(ලකුණු 02 × 03 = 06)

(iv) • ආනයනික සැකසුම් කලාප පිහිටුවීම.
• කාර්මික ජනපද පිහිටුවීම.
• ආනයන තීරුබදු සහන ලබා දීම.
• ප්‍රදර්ශන පැවැත්වීමෙන් නිෂ්පාදකයන් ධෛර්යමත් කිරීම.
• හස්ත කර්මාන්ත ගම්මාන ඇති කිරීම.
• ශ්‍රමිකයන් පුහුණු කිරීම.
• වෘත්තීය පුහුණු පාඨමාලා හඳුන්වා දීම.

(ලකුණු 02 × 03 = 06)

7. (i) නිශ්චිත වර්ෂයක දී මධ්‍ය වාර්ෂික ජන සංඛ්‍යාවෙන් දහසකට සිදුවන සජීවී උපත් සංඛ්‍යාව දළ උපත් අනුපාතිකය ලෙස හැඳින්වේ.

(ලකුණු 02)

(ii) • සංවර්ධනය වෙමින් පවතින රටවල දළ උපත් අනුපාතිකය සාපේක්ෂව ඉහළය.
• සංවර්ධිත රටවල දළ උපත් අනුපාතිකය සාපේක්ෂව පහළය.
• අප්‍රිකානු කලාපීය රටවල දළ උපත් අනුපාතිකය වෙනත් කලාපවලට සාපේක්ෂව ඉහළ අගයක් ගනියි.
• සෑම රටකම දළ උපත් අනුපාතිකය කාලයත් සමග අඩු වී තිබේ.
• 2050 වන විට දළ උපත් අනුපාතිකය අඩුම රට වන්නේ ජපානය යි.
• 2050 වන විට දළ උපත් අනුපාතිකය වැඩිම රට වන්නේ නයිජීරියාව යි.

** ඕනෑම ලක්ෂණ හතරක් නිවැරදිව ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

(ලකුණු 01 × 04 = 04)

(iii) • සංස්කෘතික ජන සමාජ පැවතීම.
• කාන්තා අධ්‍යාපනය පහළ මට්ටමක පැවතීම.
• අඩු වයසින් විවාහ වීම.
• ආගමික හා ගෝත්‍රික බලපෑම අධික වීම.
• උපත් පාලන ක්‍රම පිළිබඳ අනවබෝධය.
(ලකුණු 02 × 03 = 06)

(iv) (a) • කාන්තාවන්ගේ අධ්‍යාපන මට්ටම ඉහළ යාම.
• විවාහවන වයස කල්යාම.
• සමහර රටවල රජයන් විසින් දරු උපත් සීමා කර ගැනීමට ජනතාව පෙළඹවීම.
• සමහර රටවල් ගබ්සාව නීත්‍යානුකූල කිරීම.
• උපත් පාලන ක්‍රම ජනප්‍රිය වීම.
• දෙමාපියන් දරුවන්ගේ රැකවරණය බලාපොරොත්තු නොවීම.
• සමහර පවුල් දරු උපත් ප්‍රතික්ෂේප කිරීම.
• වැඩි වයස් පරතරයක් සහිතව දරුවන් ඉපදීම.
(ලකුණු 02 × 02 = 04)

(b) • වයස්ගත ජන සංඛ්‍යාව ඉහළ යාම.
• ශ්‍රම බලකාය සංකෝචනය වීම.
• ජාතික ආදායම වෙනත් රටවල් කරා ඇදී යාම.
• ජාතික ආරක්ෂාවට තර්ජනයක් වීම.
(ලකුණු 02 × 02 = 04)

8.(i) • දැවැන්ත ගෝලීය වත්කමක් සතු වීම.
• ඉහළ වාර්ෂික පිරිවැටුමක් තිබීම.
• සමස්ත පාලනය මව් ආයතනය සතු වීම.
• තාක්ෂණය ඉහළ මට්ටමින් භාවිතා කිරීම.
• කාර්යක්ෂම හා දක්ෂ වෘත්තියවේදීන් විසින් ආයතනය කළමනාකරණය කිරීම.
• ශක්තිමත් අලෙවිකරණය, ප්‍රචාරණය හා ප්‍රවර්ධනය මගින් ගෝලීය වෙළඳපොළ පවත්වා ගැනීම.
(ලකුණු 01 × 02 = 02)

(ii) • ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින රටවල නිෂ්පාදන වියදම අඩු වීම.
• විදේශ ආයෝජන පුළුල් කර ගැනීම සඳහා එම රටවල් ආර්ථිකය

විවෘත කිරීම.
- බදු ප්‍රතිපත්ති ලිහිල් කිරීම.
- කම්කරු නීති රීති ලිහිල් කිරීම.
- ආයෝජකයන්ට අවශ්‍ය යටිතල පහසුකම් පුළුල් කිරීම.

(ලකුණු 02 × 03 = 06)

(iii) (a) අධ්‍යාපනය හා සෞඛ්‍ය
- මාර්ගගත ඉගැන්වීම්
- අන්තර්ජාල පහසුකම්
- ලෝකය පිළිබඳ නවතම තොරතුරු දැනගැනීමේ හැකියාව.
- අතථ්‍ය විශ්වවිද්‍යාලය (Virtual Campus)
- විද්‍යුත් තැපෑල
- කෘත්‍රිම බුද්ධිය (AI)
- රෝග විනිශ්චය සඳහා නව උපකරණ හඳුන්වා දීම.
- නවීන ශල්‍ය වෛද්‍ය උපකරණ
- අන්තර්ජාලය හරහා වෛද්‍ය සේවා ලබාගැනීම.

(ලකුණු 03)

(b) බැංකු හා මූල්‍ය කටයුතු
- මාර්ගගත මුදල් ගණුදෙනු
- මුදල් භාවිතය අවම වීම (E-Commerce)
- සුරක්ෂිතතාව තහවුරු වීම (Credit Card)
- මුදල් ගණුදෙනු පහසු වීම (E-Banking)

(ලකුණු 03)

(iv)
- දේශීය කර්මාන්ත පරිහානියට පත්වීම.
- ස්වභාවික සම්පත් ශීඝ්‍රයෙන් ක්ෂය වීම.
- කුඩා පරිමාණයේ වෙළඳ සමාගම් අභියෝගයට ලක්වීම.
- තරුණ ජනයා ආටෝප ජීවිතවලට හුරුවීම.
- ආහාර පරිභෝජන රටාවේ අහිතකර වෙනස්වීම් ඇති වීම.
- සාම්ප්‍රදායික හා සංස්කෘතික වටිනාකම්වලින් ඈවත් වීම.
- තරුණ පරපුර තොරතුරු සන්නිවේදන තාක්ෂණය අවිචාරාත්මක ලෙස භාවිතා කිරීම.

(ලකුණු 02 × 03 = 06)

***

## II කොටස
## මානව භූගෝල විද්‍යාව

5.(i) රටක සමස්ත ජන සංඛ්‍යාවෙන් නාගරික ප්‍රදේශවල වාසය කරන ජන සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස දැක්වීම නාගරීකරණ දර්ශකය ලෙස හඳුන්වයි.

$$\text{නාගරීකරණ දර්ශකය} = \frac{\text{කිසියම් තෝරාගත් වර්ෂයක නාගරික ජන සංඛ්‍යාව}}{\text{මධ්‍ය වාර්ෂික මුළු ජන සංඛ්‍යාව}} \times 100$$

(ලකුණු 02)

(ii)
- නාගරික ජන සංඛ්‍යාව ශීඝ්‍රයෙන් වර්ධනය වීම.
- නාගරීකරණය දේශ සීමා ඉක්මවා බැහැරට ව්‍යාප්ත වීම.
- සංවර්ධනය වෙමින් පවතින රටවල නාගරීකරණයත් සමඟ අවිධිමත් අංශය ශීඝ්‍රයෙන් වර්ධනය වීම.
- දැවැන්ත නගර සංඛ්‍යාව ක්‍රමයෙන් ඉහළ යෑම.

(ලකුණු 02 × 03 = 06)

(iii) සමාජ ආර්ථික ගැටලු
- සම්පත් මත ඇතිවන පීඩනය.
- නාගරික දරිද්‍රතාව.
- නිවාස හිඟය හා අනවසර ජනාවාස ඇති කිරීම.
- පෝෂණ ගැටලු
- රථවාහන තදබදය
- නාගරික අපරාධ හා අපචාර
- පානීය ජල ගැටලුව

(ලකුණු 1.5 × 02 = 03)

පාරිසරික ගැටලු
- ඝන අපද්‍රව්‍ය කළමනාකරණය
- සනීපාරක්ෂක ගැටලු
- පරිසර දූෂණය
- සෞඛ්‍ය ගැටලු

(ලකුණු 1.5 × 02 = 03)

(iv) • බස්නාහිර පළාත් මහා නාගරික සංවර්ධන වැඩසටහන යටතේ නිවාස සංවර්ධනයට පියවර ගැනීම.
• කැලිකසළ හා ඝන අපද්‍රව්‍ය කළමනාකරණ වැඩසටහන් දියත් කිරීම.
• නගර අලංකරණ වැඩසටහන් දියත් කිරීම.
• අනවසර පදික ඉදිකිරීම් ඉවත් කිරීම.
• නාගරික සමාජ විරෝධී ක්‍රියාවන් අඩු කිරීමට ආරක්ෂක අංශය යොදාගත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
• නව වෙළෙඳ සංකීර්ණ ඉදි කිරීම.
• පැල්පත් හා මුඩුක්කුවාසීන් මහල් නිවාසවල පදිංචි කරවීම.

(ලකුණු 02 x 03 = 06)

6.(i) • අමුද්‍රව්‍ය
• බලශක්තිය
• ප්‍රාග්ධනය
• ශ්‍රමය
• තාක්ෂණය
• වෙළෙඳපොළ
• ප්‍රවාහනය
• ව්‍යවසායකත්වය
• රාජ්‍ය ප්‍රතිපත්ති

(ලකුණු 0.5 x 04 = 02)

(ii) (a) සීනි කර්මාන්තය
• අමුද්‍රව්‍ය ලබා ගැනීමේ පහසුව
• වගාබිම් ආශ්‍රිත ගම්මාන වලින් ශ්‍රමිකයන් සපයා ගැනීම
• නිමි ද්‍රව්‍ය ප්‍රවාහනය කිරීමේ පහසුව

(ලකුණු 01 x 03 = 03)

(b) සිමෙන්ති කර්මාන්තය
• අමුද්‍රව්‍ය සපයා ගැනීමේ පහසුව
උදා: කන්කසන්තුරේ / පුත්තලම
• ප්‍රවාහනය හා වෙළෙඳපොළ
උදා: ගාල්ල / ත්‍රිකුණාමලය

(ලකුණු 1.5 x 02 = 03)

• ලැකොලිත (නිතලාක්‍රාන්ත)

(ලකුණු 1.5 × 02 = 03)

<u>නිෂ්ක්‍රාන්ත යමහල් ස්වරූප</u>

• යමහල් අළු කේතුව

• අම්ල ලාවා ශිඛරය

• භාෂ්මික ලාවා පලිහ

• සංයුක්ත යමහල / සංයුක්ත කේතු

• කල්දේරාව

• යමහල් ප්ලගය / ජේනු ශිඛරය

• ලාවා සානු / බැසෝල්ට් සානු

(ලකුණු 1.5 × 02 = 03)

(iii) • වායුගෝලීය උෂ්ණත්වය ඉහළ යාම.

• ලාවා ගැලීමෙන් මතුපිට භූ දර්ශනය වෙනස් වීම.

• ශාක හා සතුන් විනාශ වීම.

• ලැව්ගිනි ඇතිවීම.

• අම්ල වැසි ඇතිවීම.

• වායුගෝලීය දෘශ්‍යතාව අඩු වීම.

• ජල මූලාශ්‍ර විනාශ වීම.

(ලකුණු 02 × 03 = 06)

(iv) • සාරවත් වගාබිම් නිර්මාණය වීම.

• බලශක්ති උත්පාදනය

• සංචාරක ආකර්ශනයක් වීම.

• ආර්ථික වටිනාකමක් සහිත පාෂාණ හා ඛනිජ වර්ග නිර්මාණය වීම.

(ලකුණු 02 × 03 = 06)

3.(i) A – ටයිගා (කොනිෆරස් / කේතුධර) බියෝමය

B – කාන්තාර බියෝමය

(ලකුණු 01 × 02 = 02)

(ii) (a) ව්‍යාප්තිය

• උතුරු ඇමරිකාවේ උතුරු අක්ෂාංශ 45° – 55° තෙක් උතුරට ද බටහිර යුරෝපයේදී උතුරු අක්ෂාංශ 50° – 60° තෙක් උතුරට ද ව්‍යාප්ත වේ.

• උත්තරාර්ධ ගෝලයේ මහද්වීපයන්හි බටහිර සිට

නැගෙනහිරට පටියක් ලෙස විහිදේ.

උදා: කැනඩාව, උතුරු යුරෝපයේ සිට සයිබීරියාව තෙක්

(b) දේශගුණය

- ශීත හා ග්‍රීෂ්ම සෘතු කැපී පෙනෙයි.
- සරත් හා වසන්ත සෘතු ඉතා කෙටිය.
- උෂ්ණත්වය සාපේක්ෂව අඩුය. (සාමාන්‍ය වාර්ෂික උෂ්ණත්වය 21°C - 24°C අතර වේ)
- වසර පුරා උෂ්ණත්වය විචලනය වේ.
- වසරක් තුළ උෂ්ණත්වය 0°C අඩු මාස හයක් පමණ පවතියි.
- ශීත සෘතුව ඉතා කටුකය.
- ගිම්හානයේ වුව ද දිගු දිවා කාලයක් ඇති නොවේ.
- වාර්ෂික වර්ෂාපතනය 300mm - 850mm අතර පවතියි.

(c) වෘක්ෂලතා ලක්ෂණ

- ශාක කේතුරූපාකාරය.
- ඉදිකටු වැනි ශාක පත්‍ර සහිතය.
- අධික හිමපතනයට ඔරොත්තු දීම සඳහා ශාක හැඩගැසී ඇත.
- ශාක විශේෂ ගහනය ඉතා අඩුය.
- ශාකවල උපරිම උස 12m - 20m පමණ වේ.
- යටිරෝපණය දුර්වලය.
- අඩු ජෛව විවිධත්වයක් ඇත.
- ශාක විශේෂ - ඔස්ට්‍රියන් පයින්, ෆර්, ස්ප්‍රූස්

(ලකුණු 01 + 02 + 03 = 06)

(iii) (a) ශාක දක්වන අනුවර්තනය වීම්

- සිහින් පත්‍ර දැරීම.
- පත්‍ර පතනය
- පත්‍ර ඉටි වැස්ම සහිත වීම
- දිගු මූල පද්ධතිය
- කටු සහ විෂ සහිත බව
- මාංසල කඳන් දැරීම

(ලකුණු 01 × 03 = 03)

(b) සතුන් දක්වන අනුවර්තනය වීම්

- ජලය ගබඩා කර ගැනීමට තෙල් ලියන් තිබීම (ඔටුවා)

යන දිස්ත්‍රික්ක වලින් වාර්තා වීම.

- වියළි කලාපයට අයත් නුවර පුත්තලම, මන්නාරම, මුලතිව්, වව්නියාව හා යාපනය යන දිස්ත්‍රික්ක වලින් මෙට්‍රික් ටොන් 59 999 ට වඩා අඩු වී නිෂ්පාදනයක් වාර්තා වීම.
- මහ කන්නයේ වී නිෂ්පාදනයේ පැහැදිලි අවකාශීය විෂමතාවයන් හඳුනාගත හැකි වීම.

(ලකුණු 01 × 03 = 03)

(iv)
- දිස්ත්‍රික්කයක් තුළ පවතින ප්‍රාදේශීය වෙනස්කම් පිළිබිඹු නොවීම.
- එක් එක් දිස්ත්‍රික්ක වලට අදාළ නිරපේක්ෂ වටිනාකම හඳුනාගත නොහැකි වීම.
- දිස්ත්‍රික් මායිම් ආසන්නයේ පවතින වෙනස්කම් අවබෝධ කරගත නොහැකි වීම.
- විචලය පැතිරී නොපවතින ප්‍රදේශපවා පේයා වී තිබීමෙන් වැරදි අවබෝධයක් ඇති වීම.

උදා: වී වගාව ව්‍යාප්ත වී නැති වනාන්තර, ජලාශ, කඳු වැනි විශිෂ්ට ප්‍රදේශ පවා පේයා කර පෙන්වීම.

(ලකුණු 01 × 02 = 02)

## 2021 / 2022 මහ කන්නයේ ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික්ක අනුව වී නිෂ්පාදනය (මෙට්‍රික් ටොන්)




මූලාශ්‍රය: ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2023

| | | | |
|---|---|---|---|
| 2019 | 1543 | 1814 | -271 |
| 2020 | 1496 | 1814 | -318 |
| | | $\Sigma(x-\bar{x})=$ | 2780 |

(ලකුණු 02)

(d) මධ්‍යන්‍ය අපගමනය $= \frac{\Sigma(x-\bar{x})}{n}$

$= \frac{2780}{10}$

$= \underline{\underline{278\ mm}}$ (ලකුණු 02)

(ii)

කටුගස්තොට මුළු වාර්ෂික වර්ෂාපතනය

(2011 - 2020)




මූලාශ්‍රය : සංඛ්‍යාන නිබන්ධනය, 2022

- මාතෘකාව හා මූලාශ්‍රය - 01
- X හා Y අක්ෂ නිර්මාණය - 02
- තීරු නිර්මාණය - 02

එකතුව - 05

(iii) • වැඩිම වර්ෂාපතනයක් ලැබී තිබෙන්නේ 2014 වර්ෂයේදී ය. එම වර්ෂයේ දී මධ්‍යන්‍ය වර්ෂාපතනයට වඩා 725 mm ක් වැඩියෙන් වර්ෂාපතනය ලැබී ඇත.

- අඩුම වර්ෂාපතනයක් ලැබී ඇත්තේ 2016 වර්ෂයේදී ය. එම වර්ෂයේ දී මධ්‍යන්‍ය වර්ෂාපතනයට වඩා 514 mm ක් අඩුවෙන් වර්ෂාපතනය ලැබී ඇත.
- 2012, 2013, 2014, 2015, 2018 යන වර්ෂ වල දී මධ්‍යන්‍යයට වඩා වැඩි වර්ෂාපතනයක් ලැබී ඇත.
- 2011, 2016, 2017, 2019 හා 2020 යන වර්ෂ වල දී මධ්‍යන්‍යයට වඩා අඩු වර්ෂාපතනයක් ලැබී ඇත.
- වර්ෂාපතනයේ කාලානුරූපී අඩුවීමක් හඳුනාගත හැකි වේ.

(ලකුණු 01 × 03 = 03)

5.(i) යම්කිසි වස්තුවක් හෝ ක්‍රියාකාරීත්වයක් වෙත භෞතිකව ළඟා නොවී දුර සිට හඳුනා ගැනීම, අධ්‍යයනය කිරීම, වටහා ගැනීම හා විශ්ලේෂණය කිරීමේ තාක්ෂණය දුරස්ථ සංවේදනය යි.

(ලකුණු 02)

(ii) • භූමිපාදක වේදිකා
- වාසර වේදිකා
- අභ්‍යවකාශ වේදිකා

(ලකුණු 01 × 03 = 03)

(iii) (අ) ගුවන් ඡායාරූප තාක්ෂණය

- ගුවන් ඡායාරූපයක් යනු ගුවනේ සිට නිශ්චිත පියාසර සැලැස්මකට අනුව නිශ්චිත පරිමාණයකින් යුක්තව භූමියෙහි තෝරාගත් කිසියම් කොටසක් ආවරණය වන ආකාරයට ලබා ගන්නා ඡායාරූපයකි.
- ගුවන් ඡායාරූප වර්ග දෙකකි.
  * සිරස් ගුවන් ඡායාරූප
  * ඇල ගුවන් ඡායාරූප

(මේ අතර වෙනස පැහැදිලි කර තිබිය යුතුය)

(ලකුණු 03)

(vii) සිතියම් ප්‍රදේශයේ මධ්‍යම කොටස කඳුකර භූ විෂමතා ලක්ෂණ වලින් ද, සෙසු ප්‍රදේශ තැනිතලා හා රැළි බිම් ලක්ෂණ වලින් ද සමන්විත වෙයි. මෙම භූ විෂමතා ලක්ෂණ සිතියම් ප්‍රදේශයේ මාර්ග ව්‍යාප්තිය හා කෘෂිකාර්මික භූමි පරිභෝග ව්‍යාප්තිය කෙරෙහි බලපා තිබේ.

(a) මාර්ග ව්‍යාප්තිය

- ප්‍රධාන මාර්ග, සෙසු මාර්ග, ජීප්රථ මාර්ග හා අඩිපාරවල් සිතියම් ප්‍රදේශය තුළ දැකගත හැකිය.
- මාර්ග බොහොමයක් ඉදිකර තිබෙන්නේ තැනිතලා ප්‍රදේශ ඔස්සේ ය.
- නිම්න හා කපොලු ලක්ෂණ මාර්ග ඉදිකිරීමේ දී ප්‍රයෝජනයට ගෙන තිබේ.
- සිතියම් ප්‍රදේශය මධ්‍යයේ පිහිටි කඳුකරය මාර්ග නිර්මාණය කිරීමේ දී බාධකයක් වී ඇත.
- නැගෙනහිරින් ප්‍රදේශයට ඇතුළුවන ප්‍රධාන මාර්ගය මධ්‍යයේ වූ කඳුකරය හේතුවෙන් එහි සෘජු දුර මෙන් දෙගුණයක පමණ දුරක් ගෙවා මොනරාගල නගරය වෙතට පැමිණීමට සිදු වී තිබේ.

(ලකුණු 03)

(b) කෘෂිකාර්මික භූමි පරිභෝග ව්‍යාප්තිය

- සිතියම් ප්‍රදේශය තුළ ව්‍යාප්ත කෘෂිකාර්මික භූමි පරිභෝග ලෙස ගෙවතු වගාව, වී වගාව, රබර් වගාව, හේන් වගාව හා වෙනත් වගා ලක්ෂණ හඳුනාගත හැකි ය.
- තැනිතලා බිම් ආශ්‍රිතව ගෙවතු, වී හා හේන් වගාව ව්‍යාප්ත වී පවතියි.
- තැනිතලා බිම් මෙන්ම මද බෑවුම් සහිත ප්‍රදේශවල රබර් වගාව ව්‍යාප්ත වී තිබේ.
- මධ්‍යයේ වූ කඳුකරයේ බටහිර බෑවුම් ප්‍රදේශයේ වෙනත් වගාවන් ව්‍යාප්ත වී තිබේ.

(ලකුණු 03)

2. ලෝක සිතියම පිටු අංක 4 හි දැක්වේ.

Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!

මධ්‍යම පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව, අ.පො.ස. (උසස් පෙළ) පෙරහුරු පරීක්ෂණය 2024, 13 ශ්‍රේණිය
மத்திய மாகாணக் கல்வித் திணைக்களம், க.பொ.த. உயர்தர முன்னோடிப் பரீட்சை 2024, தரம் 13
Education Department of Central Province, G.C.E. (Adv. Level) Practice Test 2024, Grade 13
භූගෝල විද්‍යාව I - புவியியல் I - Geography I




(ලකුණු 01 x 10 = 10)

සිතියම - 4

(36) WWW.PastPapers.WiKi (36)
Downloaded from Past Papers Wiki - Most Extensive Wikipedia of Past Papers!



PARCEL NO
LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් සඟරා | O/L ප්‍රශ්න පත්‍ර |
A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් |
School Book ගුරු අතපොත්
PADANAMA PUBLICATION
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න